# 7 ශ්‍රේණිය - සිංහල - පැවරුම 1

*ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.*

❖ **මුලින් ම දී ඇති පදයට සුදුසු පිළිතුර තෝරන්න.**

1. කරල පැහුණා
   - I. වී පැහුණා
   - II. කරල පැසීම
   - III. නිහතමානී බව
   - IV. වාසියක් සිදුවීම

2. තරු පෙනුණා
   - I. තරු දැකීම
   - II. බොහෝ රිදීම
   - III. අනපේක්ෂිත ගැටළුවකට මුහුණදීම
   - IV. වාසියක් සිදුවීම

❖ **සමාන නොවන පදයට යටින් ඉරක් අඳින්න.**

3. සිංහයා I. සිහ II. ගජ III. මිගරාජ IV. කෙසර

4. කුරුල්ලෝ I. සුරන් II. පක්ෂීන් III. සියොතුන් IV. සකලයෝ

❖ **විරුද්ධ පදය තෝරන්න.**

5. සතුරා I. රුපු II. මිතුරා III. පසමිතුරා IV. හතුරා

6. කාලය I. අවධිය II. සමය III. අකාලය IV. කල

7. **සිදත් සඟරා හෝඩියේ ඇති අකුරු ගණන වන්නේ**
   - I. 60
   - II. 59
   - III. 61
   - IV. 30

8. **සිංහල හෝඩියේ ඇති සඤ්ඤක අක්ෂරයක් වන්නේ,**
   - I. ඹ
   - II. ස
   - III. ධ
   - IV. හ

❖ **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.**

9.
   - I. පුස්ථකාලය
   - II. ආභාසය
   - III. පරිනාමය
   - IV. ආමන්ත්‍රන

10.
   - I. අවශේෂ
   - II. විශේශ
   - III. පස්චාත්
   - IV. නිස්චල

11. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා පිළිවෙළින් යෙදුණු පිළිතුර තෝරන්න.
   - I. නෙළමින්, නටයි
   - II. කපයි, පැන
   - III. ගයමින්, නටමින්
   - IV. දුවමින්, කපා

12. මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ, ප්‍රථම පුරුෂ නාම පද පිළිවෙළින් යෙදුණු පිළිතුර තෝරන්න.

I. තෝ, මම, අම්මා
II. මම, තෝ, අම්මා
III. අම්මා, තෝ, මම
IV. තෝ, අම්මා, මම

❖ **සුදුසු වචනය තෝරන්න.**

13. නැණ ................................... පිරිපුන් දරුවෝ වෙමු. (නුවනින් / නුවණින්)
14. ............................... ජීවීන් රැක ගැනීම අපේ යුතුකමකි. (වන / වණ)
15. හමන මඳ ............................. ගිමන නිවයි. (නල / නළ)

❖ **සුදුසු ක්‍රියා පදය තෝරන්න.**

16. තාරකා ආලෝකය ............................. (නොදෙයි / නොදෙති)
17. වඩුවා ලී පතුර ............................... (කපයි / කපති)
18. නුඹලා පොත් .............................. (බලහු / බලහි)

❖ **අනුක්ත පදය යටින් ඉරක් අඳින්න.**

19.

I. කුරුල්ලෝ
II. හාවෙකු
III. මනාලියක්
IV. මිනිස්සු

20.

I. ඔවුහු
II. ළමයි
III. ළමයෙක්
IV. තොප

## II පත්‍රය

❖ **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (i) සාම්ප්‍රදායික යෙදුම් වර්ග 2 ක් ලියන්න.
 (ii) එක් යෙදුමක් උදාහරණ 2 ක් ඇසුරින් පහදන්න.
 (iii) ජනකවි යනු මොනවාද?
 (iv) ජනකවි වර්ග 2 ක් ලියන්න.
 (v) ඔබ දන්නා ජන කවියක් ලියා දක්වන්න.

(ලකුණු 2X5 = 10)

02. පහත මාතෘකාවලින් 1 ක් තෝරා වචන 175 කට නොඅඩු රචනයක් ලියන්න.

 (i) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා
 (ii) පොලිතීන් භාවිතය අවම කරමු
 (iii) මත් රකුසා බිලිගන්න අපේ සමාජය
 (iv) පොත් කියවා දිවි සකසමු

(ලකුණු 20)

03. ලබුදූව ප්‍රදේශයේ දිනෙන් දින වර්ධනය වන ඩෙංගු වසංගතය නිසා පාසලට ඇතිවී ඇති සෞඛ්‍ය තර්ජනයට නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිමින් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත රාජකාරී ලිපියක් ලියන්න.

(ලකුණු 10)

04. පෙළ පොතේ පාඩම් ඇසුරින් පිළිතුරු සපයන්න.

පහත කියමන් කුමන පාඩමේද? කා විසින් කා හට කියන ලද්දැයි ලියන්න.

 I. "ඇයි, ඉතින්, ගැලවෙන විදියක් ඔබම කල්පනා නොකරන්නේ? "
 II. "අයියේ, අපිත් බත් කමු."

පහත කවිවල ඉතිරි පද සම්පූර්ණ කරන්න.

 III. අටු කොටුවල තියෙන බැතා
 ...........................................................................................
 ලබු ගෙඩිවල තියෙන බැතා
 ...........................................................................................

 ...........................................................................................
 ...........................................................................................
 කුමරෙකි කිතු සසුන් රජගෙයි ලත් කිරුළ
 බලයෙකි මෙවන් දන ඉපැයුම රටට හෙළ

 IV. අක්කර පහ කෘතිය ලියූ කතෘ කවුද?

(ලකුණු 2X5 = 10)

05. ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තල් කොළයයි - පොල් කොළයයි
එකින් එකට පෙළට තියා
හොඳ ලස්සන රටාවකට - කලාලයක් වියමු අපි
උතුරින් - දකුණින්
නැගෙනහිරින් - බටහිරින්
එක් ව
අත් වැල් බැඳ අවුදින් - අපේ පුංචි දරුවන්ට
එකතුවෙලා වාඩිවෙන්ට - කලාලයක් වියමුව අපි
අඳින ඇඳුම් - දෙඩන වදන්
වෙනස් වුණත් - බඩගින්නට
එකම හඬින් උන් ගයන්නේ - එකම ගීය බව එතකොට
කාටත් පැහැදිලිව දැනෙය

I. මේ පද්‍යවලින් මිනිසුන් එකිනෙකාට වෙනස් වී ඇති බව කියවේ. ඒ කෙසේද?
II. ජාති කුල භේදවලින් තොරව සෑම දෙනාටම දැනෙන දෙය කුමක්ද?
III. මෙහි ඇති උතුර, දකුණ වැනි ප්‍රදේශවවලින් ජාතීන් කිහිපයක් සංකේතවත් වෙයි. ඒ මොනවාද?
IV. මෙහි සඳහන් පරිදි අනාගතය ගොඩනැගීමට සමගිව අත්වැල් බැඳ කටයුතු කළ යුතු බව සඳහන් පද්‍ය පාඨ උපුටා දක්වන්න.
V. මෙහි සඳහන් විරුද්ධ පද යුගල දෙකක් ලියන්න.

# පැවරුම්

01. 9 වන පාඩමේ සිට 16 පාඩම දක්වා සියලු පාඩම් කියවන්න.

02. පාඩම කියවා දෙමාපිය අත්සන පාඩම අවසානයේ යොදන්න.

03. එම පාඩම් ඇසුරින් එක පාඩමකින් ප්‍රශ්න 15 බැගින් සකසා පිළිතුරු සපයන්න.

04. දිනකට එක බැගින් රචනා ලියන්න.

I. සාරධර්ම සුරකිමින් යහපත් සමාජයක් තනමු.
II. වසංගත රෝග තත්වයවන්ට මුහුණදීමට අප රැක ගත යුතු පුරුදු
III. අනාගතයට අවැසි පුරවැසියකු වීමට ඉගෙනීම ලබමු.
IV. ගුණ - නුවණින් යුතු පිරිපුන් වැසියන් වෙමු.
V. පැරණි ජන ජීවිත තුළින් අපට ගත හැකි ආදර්ශ
VI. ජන කවි සාහිත්‍යයෙන් ඔපවත් වූ ගැමි ජීවිත
VII. අපේ දිවිය සුන්දර කිරීමට ආගම පිටුබලයක් වෙයි
VIII. කියවීම තුළින් ලැබිය හැකි ජීවිත අත්දැකීම්
IX. අභිකුණ්ඨික ජනතාව හා ඔවුන්ගේ සිරිත් විරිත්
X. එඩ්මන්ඩ් පීරිස් දරගුරු හිමිගෙන් ලද හැකි ආදර්ශ